චක්‍රලේඛ අංක 18/95

මගේ අංකය: බප/සසේකො/ලේ.නි.
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත,
මාළිගාවත්ත - කොළඹ 10
1995.11.17.

බස්නාහිර පළාතේ සියළුම සමුපකාර සමිති
සභාපතිවරුන් වෙත.

මහත්මයාණෙනි,

සමුපකාර සේවකයන්ට සංයුක්ත දීමනා ගෙවීම.

උක්ත කාරණයට අදාලව ම විසින් නිකුත් කර ඇති අංක 15/95 හා 95.07.11 වන දින චක්‍රලේඛයට වැඩිමනත්ව ය. එම චක්‍රලේඛයේ 06 වන ඡේදයට අනතුරුව පහත සඳහන් ඡේදය ඇතුලත් කිරීමෙන් එම චක්‍රලේඛය මින් සංශෝධනය කරමි.

07. සාමාන්‍ය රාජකාරි ඉටු කිරීමේදී වැඩිපුර ගමන් බිමන් යාමට සිදුවන සේවකයකු සම්බන්ධයෙන් සංයුක්ත දීමනාව වෙනුවට මාසික නිශ්චිත (පරිවර්ජිත) දීමනාවක් නියම කිරීමට අදාල සමුපකාර සමිතියට පුළුවන. එවැනි අවස්ථාවලදී අංක 15/95 දරණ චක්‍රලේඛයේ 01 වන ඡේදයෙන් නියම කර ඇති ගාස්තු ප්‍රමාණයන් අනුව සංයුක්ත දීමනා ලබා ගැනීමට එම සේවකයාට හිමිකමක් නැත. නිශ්චිත දීමනාව නියම කිරීමේදී අදාල සේවකයාට සිය සාමාන්‍ය රාජකාරි ඉටු කිරීමේදී යාමට සිදුවන ගමන් බිමන් සංඛ්‍යාව හා සමිතියේ මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගතයුතු වේ., එසේම නියම කරනු ලබන සම්පූර්ණ දීමනාව ලබා ගැනීමට අවශ්‍ය උපරිම සැතපුම් ගණන ද නියම කළයුතු අතර, අවශ්‍ය ප්‍රමාණයේ ගමන් බිමන් කර නැති විට අනුපාතික අඩු කිරීමක් කරනු ලැබිය හැකි ය.

මෙයට,
කොමිෂන් සභාවේ නියමය පරිදි,

පී.ඩී. චන්ද්‍රදාස,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:- 1. ප්‍රධාන ලේකම්(බ.ප.)-දැන ගැනීමට
2. ලේකම්, සෞඛ්‍ය, සමුපකාර හා වනිතා කටයුතු අමාත්‍යාංශය (බ.ප.) - ගරු ඇමති තුමා ගේ අවධානයට යොමු කිරීම පිණිස.
3. ස.සං.කො.රෙ.(බ.ප.)
4. සහකාර සමුපකාර සං.කො. - කොළඹ, කළුතර, ගම්පහ
5. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව.
6. සියලුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු.